# <u>කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය</u>

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

## <u>ටෙන්ඩර් දැන්වීම</u>

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10, ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 09 මහලේදී **2025.10.17** දින **පෙ.ව. 11.00** වේලාව වන තෙක් පහත සඳහන් කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| අංක | කොන්ත්‍රාත් අංකය | වැඩ විස්තරය | අවශ්‍ය සීඩා/ ඉක්ටැඩ් ශ්‍රේණිය හා ක්ෂේත්‍රය | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල (රු.) |
|---|---|---|---|---|
| **1** | **DDG/TS/CON/B/IRR/76** | **මහවැලි "බී" කලාපයේ, මාදුරුඔය වම් ඉවුරු ප්‍රධාන ඇළෙහි කි.මි. 7+650 සිට කි.මි. 8+150 දක්වා, කි.මි. 27+200 සිට කි.මි. 27+300 දක්වා සහ කි.මි. 40+150 සිට කි.මි. 40+350 දක්වා වූ කොන්ක්‍රීට් අස්තරණය අලුත්වැඩියා කිරීම සහ අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම** *(*වැට් රහිත ඇස්තමේන්තු මුදල **රු. මි. 13.96** (අවිනිශ්චිත *මිල* විචලනයන් අන්තර්ගත වේ) සහ කොන්ත්‍රාත් කාලය **දින *365)*** | අවම C7 වාරිමාර්ග හා ජලාපවාහන සඳහා | **4,500.00** |
| **2** | **DDG/TS/CON/B/R/78** | **මහවැලි "බී" කලාපයේ, මාදුරුඔය වම් ඉවුරු ප්‍රධාන ඇල මාර්ගයේ කි.මි. 15+720 සිට කි.මි. 19+700 දක්වා සහ කි.මි. 36+700 සිට කි.මි. 38+000 දක්වා පිහිටි මාර්ගය (වළවල් පිළිසකර කර) අලුත්වැඩියා කිරීම.** **(**වැට් රහිත ඇස්තමේන්තු මුදල **රු. මි. 13.86** (අවිනිශ්චිත *මිල* විචලනයන් අන්තර්ගත වේ) සහ කොන්ත්‍රාත් කාලය **දින 210)** | අවම C7 මහාමාර්ග සඳහා | **4,500.00** |

මෙම කාර්යයන් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු වනුයේ ඒ ඒ කාර්යය සඳහා ඉහත සටහනෙහි සඳහන් කර ඇති ඉදිකිරීම් ශ්‍රේණියට සහ ක්ෂේත්‍රයට අදාලව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ(CIDA) ලියාපදිංචි වී ඇති සහ මිලියන 5 ඉක්මවන කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වන විට ලංසුකරුවන් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිදාන යටතේ සමාගම් රෙජිස්ටාර් කාර්යාලයේද ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් පමණි.

මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ සිදු කරන අතර, රජය විසින් වරින් වර නිකුත් කරන ලබන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛනයන්ගේ සඳහන් කොන්දේසි ද අදාලවේ.

අදාල සුදුසුකම් සහිත කොන්ත්‍රාත්කරුවන් සමාගම් ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර මුදලින් ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා **කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 3 වන මහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා)** ගේ කාර්යයාලයෙන් මෙම කාර්යයන් සඳහා වූ ටෙන්ඩර් පත් කට්ටල ලබා ගත හැක. ටෙන්ඩර් පත් නිකුත් කරනුයේ **2025.10.03** දින සිට **2025.10.16** දින දක්වා **පෙ.ව. 09.30 සිට ප.ව. 03.00 දක්වා** පමණි. ඕනෑම ටෙන්ඩර්කරුවකුට එක් කාර්යයකට වඩා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට හැකි වුවත් කොන්ත්‍රාත් ප්‍රදානය කරනු ලබන්නේ කොන්ත්‍රාත්කරුගේ (CIDA) ලියාපදිංචි සීමාවන්ට අනුකූලව පමණි.

ටෙන්ඩර් පත් **කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 3 වන මහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා)** ගේ කාර්යයාලයෙන් **2025.10.03** දින සිට **2025.10.16** දින

දක්වා වැඩකරන දිනයන්හි **පෙ.ව. 09.30 සිට ප.ව 04.00** දක්වා කිසිදු ගෙවීමකින් තොරව පරීක්ෂා කල හැකි අතර **http//mahaweli.gov.lk** වෙබ් අඩවිය හරහාද ටෙනඩර් පත් පරීක්ෂා කල හැක.

කවරයේ ඉහල වම් කෙලවර ටෙන්ඩරයේ නම සහ අංකය පැහැදිලිව සඳහන් කර, මුල් පිටපත හා තවත් පිටපතකින් යුතුව කවරයේ බහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් **2025.10.17 දින පෙ.ව. 11.00** ට පෙර ලැබෙන සේ **කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 9 වන මහලේ අධ්‍යක්ෂ ජනරාල්** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය, නැතහොත් අතින් ගෙනවිත් භාර දිය යුතුය. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් පත් විවෘත කරන අතර ටෙන්ඩර් පත් ඉදිරිපත් කල ටෙන්ඩර්කරුද ඔහුගේ නියෝජිතයින්ද ඇතුළුව දෙදෙනෙකුට නොවැඩි වන සංඛ්‍යාවකට එම අවස්ථාවට සහභාගී විය හැක.

මෙම කාර්යයන් පිලිබඳ වැඩි විස්තර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, තාක්ෂණ සේවා අංශය වෙතින් ලබාගත හැක.

දුරකථන අංක **011-2473264, 011-2689651**

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**